# බුදුරදුන් දුටු මිනිසා

ගරු අත්තංගනේ රතනපාල හිමි

බුදුරදුන් ලොව පහලවන විට භාරතය විවිධ ආගමික සංකල්පනයන් ගෙන් පිරී පැවතිණ. විමුක්තිය සෙවීම පරමාර්ථය කොට ගත් බොහෝ දෙනා වෙතින් නව දර්ශනයක් බිහිවීය. වෛදික ආගමික පිළිවෙත් වලින් මහජනතාව හිරිහැර විඳි යුගයක සිද්ධාර්ථ ගෞතමන් වහන්සේගේ නව දර්ශනය ද ලොව එළිදැක්විණ. භක්ති වාදය ගුරුකොට ගත් මුළා වූ ජනතාව වෛදික දේව සංකල්පය මගින් බැඳ දමා තිබිණ. දෙවියන්ගේ අධිකාරීන බලයට මහජනතාව යටත්කර තැබීමට බ්‍රාහ්මණ පූජකයන්ට හැකිවිය. මිනිසා සතු බලය දෙවියන්ගේ අනුහසින් ලැබුණක් බව වෛදික ජනතාව තුළ කුළු ගැන්වූයේ මේ බ්‍රාහ්මණ පිරිස් විසිනි. ස්වභාව ධර්මයේ බලපෑම සාමාන්‍ය ජනතාවට වැළැක්වීමට නොහැකි වූ විට එය දෙවියන් ගේ අනුහසින් සිදුවන්නක් ලෙස දැක්වීමට ලාභාපේක්ෂක බ්‍රාහ්මණ පූජකයන් දැරූ තැත සඵල විය. ස්වභාව ධර්මයේ ඇතැම් අවස්ථාවන් දේවත්ත්වයෙන් සැලකීමට පුරුදු වූ ජනතාව ගේ එක ම ගැළවුම්කරුවා වූයේ දෙවියා ය. දෙවියන් සැනසීමට, සතුටු කිරීමට බ්‍රාහ්මණ පූජකයන් විසින් අනුගමනය කළ ක්‍රියා මාර්ගය බොහෝ දෙනාට හිංසාකාරී විය. මිනිස් අයිතිවාසිකම් හා මිනිසා සතු බලය දෙවියන් සතු විය. දෙවියන් ගේ අණසකට සියල්ල ම යටත් වෙද්දී මිනිසා පීඩාවට පත්විය. මෙවන් යුගයක ලොව පහළ වූ බුදුරජාණන් වහන්සේ දෙවියන්ටත් වඩා උසස් මිනිසකු දුටු සේක.

මිනිසා සතු නිදහස ආගමකින් සීමා කෙරේ නම් එය සමාජ ප්‍රගතියට බාධකයකි. ආගමකින් විශේෂයෙන් සිතීමේ හා විමසීමේ නිදහස මිනිසාට ලබාදිය යුතුය. එය අවබෝධ කළ බුදුරදුන්ගේ දර්ශනයෙහි චින්තන නිදහසට හා විමසීමේ නිදහසට ප්‍රධානත්වයක් ලැබී ඇත. එබඳු නිදහසකින් තොරව නිවැරදි දර්ශනයක් අවබෝධ කළ නො හැකිය. ධර්මය, සංඝයා ගැන පමණක් නොව බුදුරදුන් පිළිබඳව ද විමසීමට බුදු දහමින් අවසර දී ඇත. අන් කිසිම ආගමක නැති නිදහසක් ලෙස එය දැක්විය හැකිය. බුදුරජාණන් වහන්සේ අවබෝධ කළ ධර්මය සියල්ලන්ට ම, නියමිත ප්‍රතිපදවෙහි ගමන් කළහොත් අවබෝධ කළ හැකි බවද, එපමණක් නොව බුද්ධත්වය පවා සෑම මිනිසකුට ම ලැබිය හැකි තත්ත්වයක් බව ද වදළහ. වෙනත් ආගමක සර්වබලධාරී දෙවියන් වහන්සේ ගේ තත්ත්වය ලැබීමට කිසිවෙකුටත්, කවරදවත් නො හැකිය. මහා බ්‍රහ්මයාගේ තත්ත්වය ද එසේය. එහෙත් බුද්ධත්ත්වයට මාර්ගය සෑම කෙනෙකුට ම විවරව පවතී. අවශ්‍ය වන්නේ පිළිවෙත් පිරීමයි. බුද්ධත්වය ලැබිය හැක්කේ ද මිනිසෙකුට පමණි. මනුෂ්‍යත්වය මෙන් ම පුරුෂාත්මය ද ලැබිය යුතුය. එසේ බලන විට දෙවියාටත්, බ්‍රහ්මයාටත් වඩා ශ්‍රේෂ්ඨ වූ ලොව කිසිවෙකුටත් දෙවැනි නොවන බුද්ධත්වය පවා ලැබිය හැක්කේ මිනිසාටය. ඒ බුදුරදුන් දුටු මිනිසායි. ඒ බුදුරදුන් මිනිසාගේ තත්ත්වය, හැකියාව පැහැදිලි කළ අයුරු යි.

ලෞකික ජීවිතයේ නිසරු බව අවබෝධ කරගත් උපනිෂද් යුගයේ ජනතාව කර්ම මාර්ගයෙන් වෙන්ව ඥාණ මාර්ගයට පිවිසෙත් ම ආත්ම විමුක්තිය සඳහා දෙවියන් සරණ පතන විට, බුදුරජාණන් වහන්සේ;

"අත්තදීපා විහරථ, අත්ත සරණා අනඤ්ඤ සරණා"? යි තමා ගේ වගකීම තම තමන්ට ම භාරකළ බව පෙනේ. කිසිවකුගේ පිහිටක් බලාපොරොත්තු නොවී තමා ම තමාගේ විමුක්තිය සලසා ගතයුතු බව එයින් කියැවෙයි.

"සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤෝ-මඤ්ඤං විසොධයෙ"? තමා ගේ පිරිසිදු බව හෝ අපිරිසිදු බව තමා විසින් ම ඇති කරගත්තක් මිස එය කිසිවකු විසින් කරනු ලබන්නක් නොවේ. වෛදික බ්‍රාහ්මණයින් මිනිසා ගේ වගකීම දෙවියන්ට භාර කළ අතර මනුෂ්‍යත්වයේ උත්තරීතර භාවය මත බුදුරදුන් එය මිනිසාට ම භාරදුන් බව පැහැදිලිය. මේ සැම දේශනාවකින් ම බුදුරදුන් පැහැදිලි කිරීමට බලාපොරොත්තු වූයේ මිනිසා සතු ස්වාධීනත්වය යි. එය සර්වබලධාරී දෙවියන් වහන්සේට වත්, මහා බ්‍රහ්මයාටවත් උන්වහන්සේ භාර නොකළහ. මේ අනුව බුදුරදුන් දුටු මිනිසා අපරිමිත බලයක් හා හැකියාවක් ඇත්තෙකි. ඒ සසර දුක සමනය කරනු සඳහා ය. විමුක්තිය ලබනු පිණිස ය.

"චිත්තෙන නීයතී ලොකො
චිත්තෙන පරිකස්සති
චිත්තස්ස එක ධම්මස්ස
සබ්බෙව වස මන්වගූ"?

යනුවෙන් මිනිසා සතු සිතේ ස්වභාවය පැහැදිලි කළ බුදුරජාණන් වහන්සේ එම සිතින් සත්වයා නොයෙක් ස්වභාවයන්ට පමුණුවන බවත්, නා නා වාසයන්හි ඉපදීමට සත්වයාගේ චිත්ත ක්‍රියා කාරිත්වය ඉවහල් වන බවත් වදළහ. ලොව සියල්ල වසඟ වී ඇත්තේ සිත නම් වූ මේ එකම ධර්මයට ය. මේ අනුව මිනිසා උසස් පහත් කිරීම චිත්ත ක්‍රියාකාරිත්වය අනුව සිදු වන්නකි. උපතින් මිනිසා උසස් හෝ පහත් හෝ නොවේ. ඒ ඒ තැනැත්තා කරන ක්‍රියාවන් අනුව උසස් පහත් වන බව බුදු වදනයි. මනුෂ්‍යත්වය බුද්ධත්වය නම් වූ ශ්‍රෙෂ්ඨම ස්ථානයන් කරා දියුණු කර ගැනීම හෝ එය පිරිහෙළා ගැනීම මිනිසාගේ ශක්තිය මත පවතී. සිතක ස්වභාවයෙන් ඇතිවන විවිධ අකුසල සිතිවිලි විනාශ කරදමා මිනිස් සිත දියුණු කර යහපත් චේතනාවන් ඇතිකර ගැනීම මිනිසා සතුය. සිත පිළිබඳ මනා විග්‍රහයක් කළ බුදුරජාණන් වහන්සේ එය ලොව ඇති අනුපමේය බලවේගය බවත්, මිනිසා තුළ පවත්නා අන්තර්ලීන ශක්තිය මතුකර ගත හැක්කේ එම චිත්ත දියුණුවෙන් බවත් වදළහ. අකුසල චෛතසික වලින් සිත දූෂණය කරගෙන මිනිස් බව පවා පිරිහෙළා ගන්නා පුද්ගලයන් මනුෂ්‍ය තිරිසන් ගණයට ඇතුළත් කොට ඇති අයුරුත්, ලෝභාදී අකුසල චෛතසික මැඩ ශෝභන චෛතසික සිතෙහි වැඩීමෙන් මනුෂ්‍යත්වයේ උත්තරීතර බව ප්‍රකට කරන උසස් මිනිසෙකු වන අයුරුත් වදළ බව පෙනේ.

"අප්පමත්තො උභො අත්ථෙ
අධිගණ්හාති පණ්ඩිතො"

අප්‍රමාදයෙන් යුතුව ඉහලොකාර්ථ, පරලොකාර්ථ දෙකත්, ආත්මාර්ථ-පරාර්ථ දෙකත් සලසාගෙන අවසානයේ දී මොක්ෂාර්ථය සලසාගන්නා උතුම් මිනිසෙකු බව වදළ. අයුරු පෙනේ.

මනුෂ්‍යත්වයේ ඵලය එය වන හෙයිනි මෙලොව ශ්‍රෙෂ්ඨ මිනිසෙකු ලෙස ජීවත් වන කල්හි පරාර්ථය මෙන් ම ආත්මාර්ථය ද සලසාගත යුතු ය.

"අත්තදත්ථං පරත්ථෙන
බහුනාපි න හාපයෙ"

බොහෝ කොට පරාර්ථය සඳහා කටයුතු කිරීමට ගොස් ආත්මාර්ථය කෙළෙසා නොගතයුතුය, යන්නෙන් එය පැහැදිලි වෙයි. ස්වකීය විමුක්තිය සඳහා කටයුතු සම්පූර්ණ කරගෙන අන්‍යයන්ට ඒ සඳහා උදව්දීම උතුම් මිනිසෙකු ගේ ලක්ෂණයෙකි. පඬිවරයෙකු ලෙස බුදුරදුන් හඳුන්වා ඇත්තේ

උතුම් මිනිසා ය. ''පණ්ඩිතානං ච සෙවනා'' යි උතුම් මිනිසෙකු ඇසුරු කළයුතු බව කියැවෙයි.

ලෝකයෙහි විද්‍යමාන මිනිස් වර්ගයා ස්වකීය මනුෂ්‍යත්වය ප්‍රයෝජනයට ගන්නා ආකාරයෙන් උසස් බවට හා පහත් බවට පැමිණෙන අයුරින් කොටස් හතරකට වර්ග කළ බව සංයුත්ත නිකායේ කෝසල සංයුත්තයෙහි සඳහන් වෙයි.

''චත්තාරො මෙ මහාරාජ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො? තමො තම පරායණො, තමොජොති පරායණො, ජොති තම පරායණො, ජොති ජොති පරායණො ති.''

බුදුරදුන් විසින් කරන ලද මේ විග්‍රහයේ දී නියම මිනිසෙකු ලෙස දුටුවේ කවරෙක්දැයි විමසිය යුතුය.

තමො තම පරායණ පුද්ගලයා අඳුරෙන් අඳුරට යන්නා යි. මනුෂ්‍යත්වයේ උත්තරීතර භාවය ලබාගත නො හැකිව පිරිහී වාසය කරන ඔහු අයහපතෙහි ම යෙදෙයි. ඒ කර්ම හේතුවෙන් මතු ජීවිතය ද අයහපත් කරදරකාරී වෙයි. ඔහුගේ මනුෂ්‍යත්වය ඵල නො ලබා පිරිහීමට පත්වෙයි.

''තමො ජොති පරායණො''යි මෙහි දක්වන පුද්ගලයා අඳුරෙන් එළියට යන්නා යි. ඔහු පූර්ව භවයේ දී කරන ලද ක්‍රියාවන්හි තත්ත්වය අනුව මෙලොව අඳුරේ ජීවත් වුවත් මෙලොව දී කල්‍යාණ මිත්‍ර සේවනාදිය හේතුවෙන් අඳුරු ජීවිතයෙන් ඉවත් ව ආලෝකමත්, යහපත් ජීවිතයකට හැඩගැසේ නම් ඔහුට තරමක් හෝ මිනිසත් බව සඵල කරගත හැකිවෙයි.

''ජොති තම පරායන'' පුද්ගලයා ලෞකික සැප සම්පතින් ආඪ්‍යව වෙසෙතත් ක්‍රියාවන් ගේ පහත් භාවය නිසා ඉදිරි ජීවිතය අඳුරෙහි වැටෙයි. ඒ පුද්ගලයා පාපමිත්‍ර සේවනාදිය හේතුවෙන් එබඳු තත්ත්වයකට පත්විය හැකිය. ඔහු ආලෝකයෙන් අඳුර කරා ගොස් මනුෂ්‍යත්වය පිරිහෙළා ගන්නා ලෙස හැඳින්වේ.

''ජොති ජොති පරායණො'යි දක්වන ලද පුද්ගලයා ආලෝකයෙන් ආලෝකය කරා ම යන්නායි. ඔහු පූර්ව ජන්මයෙහි කරන ලද යහපත් ක්‍රියා හේතුවෙන් මෙලොව මිනිසත් බවක් ලැබ උසස් මිනිසෙකු වීමට හේතුවන ක්‍රියාවන්හි යෙදෙයි. එබැවින් ඔහු උත්තරීතර මනුෂ්‍යත්වයෙහි ඵල ලබයි. බුදුරදුන් දක් වූ උසස් මිනිසා ඔහුය. අඳුරින් ආලෝකය කරා යන්නා ද උසස් තත්ත්වයෙහි ලා ගිණිය හැකිවේ. ස්වකීය බුද්ධිය, ප්‍රඥාවන් බව මිනිසත් බවේ උපරිම තත්ත්වය ලබාගැනීම සඳහා හේතුවෙයි. එයින් මිනිසා සතුව ඇති අදෘශ්‍යමාන වූ අන්තර්ලීන ශක්ති විශේෂය ඉස්මතු කොටගනී. බුදුරදුන් දුටු ශ්‍රේෂ්ඨ මිනිසා ඔහුය. මනුෂ්‍යත්වය ලැබූ ස්ත්‍රී වර්ගයාට වුවද මිනිසත් බව ඵල ගන්වන ක්‍රියා මාර්ගය අනුගමනය කිරීමෙහි බාධාවක් නැත. ස්ත්‍රී ආත්ම භාවයක් ලැබීම මිනිසත් බව සඵල කර ගැනීමට බාධාවක් විය නො හැකිය.

''ඉත්ථී භාවො කිං කයිරා
චිත්තම්හි සුසමාහිතෙ
ඤාණම්හි වත්තමානම්හි
සම්මා ධම්මං විපස්සතො.''
(භික්ඛුණී සංයුත්ත - සොමා සුත්ත.)

යනුවෙන් බුදුරදුන් ඒ බව වදළහ. ජීවිතයක් සඵල කර ගැනීමට අදාළ කරුණු රාශියක් ගිහිවිනය ආදී සූත්‍රධර්ම රාශියකින් ම හෙළි දරව් වේ. පරාභව සූත්‍රයේ දී මනුෂ්‍යත්වය පිරිහෙන හැටිත්, ව්‍යග්ඝපජ්ජ - මංගල සූත්‍රාදියෙන් එය සඵල කරගන්නා අයුරුත් දක්වා ඇත. මිනිසාගේ ජීවිතය පරිහානිය කරා යොමු කරවන ධර්මයෙහි යමෙක් හැසිරෙතොත් ඔහු මිනිසත් බවෙන් පිරිහේ. ඔහු නියම මිනිසෙකු ලෙස දැක්විය නො හැකිය. වසල සූත්‍රයේ දී මිනිසා වසලයකු

බවට පත් කරන ධර්ම දක්වූ බුදුරජාණන් වහන්සේ ඒ වසල කරණ ධර්මයන්ගෙන් වැළකී ජීවත්වන්නා උසස් මිනිසෙකු බව වදළහ. බුදුරදුන් මිනිසෙකු ලෙස දුටු තැනැත්තා එබඳු ගුණාංගයන්ගෙන් යුක්ත වූවෙකි. මිනිසා තුළ පවත්නා අද්‍යාශ්‍යමාන ශක්තිවේගය ඉස්මතු කරන ප්‍රතිපත්ති මාර්ගය මිනිසා ගේ උත්තරීතර බව ප්‍රකට කළ හැකි ඒකායන මාර්ගය වෙයි. එය මානසික දියුණුව ඇතිකර ගැනීමට මහෝපකාරී වන්නකි.

''අන්ධභූතො අයං ලොකො
තනුකෙත්ථ විපස්සති
සකුණ්තො ජාල මුත්තොව
අප්පොසග්ගාය ගච්ඡති''

ලෝකයෙහි බොහෝ දෙනා අන්ධයි. යහපත දකින නුවණැස ඇති අය ටික දෙනයි. දැලෙන් මිදී යන්නා වූ පක්ෂී සමූහයා අල්පවන්නාසේ ස්වර්ගයට යන්නා වූ මනුෂ්‍යයෝ ඉතා අල්පය.

මේ අනුව විමසා බැලීමේදී මනුෂ්‍යත්ව යෙහි ඵල ලබන්නෝ ද ඉතා ටික දෙනෙක් බව පැහැදිලිය. මේ ස්වල්ප දෙනා ලෙස ගැනෙන්නේ මනුෂ්‍ය ධර්මය පිළිපැද මිනිසත් බව සඵල කර ගත්තෝයි. බුදුරදුන් දුටු මිනිසාද එබඳු මිනිසත් බව සඵල කරගත්තෙකි.

ලොව සිල්වතුන් ඉතා ස්වල්පය. දුස්සීල අය බොහෝ ය. ඒ අනුව බුදුරදුන් දුටු මනුෂ්‍යත්වය සඵල කර ගත් උත්තරීතර පුද්ගලයන් ඉතා අල්පයි. නො පැමිණි අය ම බොහෝ දෙනෙකි. ''අතිවාක්‍යං තිතික්ඛිස්සං දුස්සීලොහි බහුජ්ජනො'' යි වදළ දේශනා පාඨයෙන් ද ඒ බව පැහැදිලි වේ.

මේ අනුව මිනිසා කර්මය අනුව ක්‍රියා කරන, උත්පත්තියෙන් නොව කාලීනව ක්‍රියාවන් නිසා උසස් පහත් වන, නිතර ආශාවන් සඳහා සටන් කරන, ආශාවන් නිසා ම නොමඟ ගිය කෙළෙස් වලින් ගහණ වූවෙකි. ලෝභාදී කෙළෙස් නිසා සසරට බැඳුණෙකි. මිනිස් සිත විවිධ අරමුණු හේතුවෙන් කෙළෙස් වලින් ගහණව පවතී. ඒවා ක්‍රමයෙන් ඉවත් කොට අලෝභාදී ශෝභන චෛතසික වැඩිය යුතුය.

ශෝභන චෛතසික සිතෙහි ක්‍රමයෙන් වඩත්ම සිතෙහි අකුසල චෛතසිකයන් පහව පිරිසිදු වයේ. ඒ පිරිසිදු බව ලැබූ තැනැත්තා උතුම් මිනිසෙකි. බුදුරජාණන් වහන්සේ මිනිසෙකු ලෙස දුටුවේ ඔහු ය. ඒ අනුව ''බුදුරදුන් දුටු මිනිසෙකු'' වීමට අප ද උත්සාහ කළ යුතු ය.